# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,880 — 1969 නොවැම්බර් 14 වැනි සිකුරාද — 1969.11.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1791 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1795 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1796 | රට තීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1799 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම් පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම් සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන් ගේ කායඕාල වලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට අත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කායඕාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. රජයේ අර්ථ සාධක අර මුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**3. වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය :—

**ඒකාබද්ධ වැටුප :**— රුපියල් 6,720—12×360—11×480—16,320 (රුපියල් 11,520 ට සහ රුපියල් 14,400 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කායඕක්ෂමතා කඩඉම් ඇත.)

(**සටහන :**—1969. 10. 1 දිනට පෙර අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4,080—12×360 සහ 10×480—13,200).

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම් පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1969 දෙසැම්බර් මස 12 දිනට අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි බව,
(රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ට වයස් සීමාවන් අදාල නොවේ).

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයයක ගෘහ අර්ථ සංරක්ෂණය පිළිබඳ උපාධිධාරිනියෙකු බව,

**සටහන :** ග්‍රාමීය ගෘහ අර්ථ සංරක්ෂණ ක්ෂෙත්‍රයෙහි පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (**සැ. යු. :** අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.** (i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාතීමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාතීමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කායඕාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම් කරුවන් විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 1, තැ. පෙ. 500, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඕාලයේ දීය.

I1-587/2—69.11.14 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වරාය ග්‍රාම කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ තම්පලාගම පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) ලේකම් ධුරය

වරාය ග්‍රාම, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කායඕාලය යේ සහ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කායඕාල, ග්‍රාම සේවක කායඕාල, පළාත් පාලන ආයතන කායඕාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඕාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඕාල වල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කායඕාලයයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1969 දෙසැම්බර් මස 15 වෙනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

සෝමපාල ගුණධීර,
දිස්ත්‍රික් ලේකම්.

1969 ඔක්තෝබර් 31 දින,
ත්‍රිකුණාමලයේ,
දිස්ත්‍රික් ලේකම් කායඕාලයේ දීය.

11-485—69.11.14 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ඉංග්‍රීසි ගුරු විභාගය—1970 පෙබරවාරි

ඉහත නම් සඳහන් විභාගය, අම්බලන්ගොඩ, අනුරාධපුරය, බදුල්ල, බන්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, දඹුල්ල, දික්වැල්ල, ඇහැලියගොඩ ගල්ගමුව, ගාල්ල, හෝමාගම, හොරණ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුලියාපිටිය, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නාවලපිටිය, මීගමුව, නුවරඑළිය, පේදුරුතුඩුව, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව සහ වේයන්ගොඩ යන මධ්‍යස්ථානයන්හි 1970 පෙබරවාරි මස 27 වන දින පවත්වනු ලැබේ.

2. ආදර්ශ අයදුම් පත්‍රය මේ සමග ඇත. එය ඒ ආකෘතිය අනුවම අගල් 8″ × 13″ ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (අයදුම් පත්‍රය යතුරු ලියනය කරවා ගන්නේ නම් ඉතා මැනවි.) කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ, විභාග කොමසාරිස් වෙත **1969 දෙසැම්බර් මස 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචිකළ තැපැලෙන් එවිය යුතුය.** විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ ඇති ආකෘතියට සම නොවන ලෙස අයදුම්කරුවන්ට උවමනා අන්දමට පිළියෙල කොට එවන අයදුම්පත් හා අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නො ලැබේ.

3. අයදුම්පත්‍රය විභාග කොමසාරිස් වෙත එවීමට ප්‍රථම "1965 හා ඉන්පසු පවත්වනු ලබන ඉංග්‍රීසි ගුරු විභාගය සඳහා සංශෝධිත" ඉංග්‍රීසි ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය කියවා මනා අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

4. සංශෝධිත නිර්දේශයේ "ඒ" කොටස පත්‍ර තුනකින් සමන්විත වේ. එනම්,

1. ඉංග්‍රීසි භාෂාව I
2. ඉංග්‍රීසි භාෂාව II හා
3. ඉංග්‍රීසි සාහිත්‍යය ; හෝ
විද්‍යාමය ඉංග්‍රීසි හෝ වාණිජ්‍යමය ඉංග්‍රීසි වශයෙනි.

නියමිත පෙළ පොත් එකක් හෝ වැඩි ගණනක් සොයාගැනීමට නොහැකිවූ අයදුම්කරුවන්ට එම පොත් සොයා නොගත්තත් තුන් වැනි ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයීමට පහසු වනු පිණිස නියමිත පොත්වලින් දෙනු ලබන ප්‍රශ්න වලට අමතරව වෛකල්පික වශයෙන් වෙනත් ප්‍රශ්න ද දෙනු ඇත.

5. ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය ආණ්ඩුවේ පොත් ආයතනයෙන් ශත 50 ක් ගෙවා මිලදී ගත හැකිය. තැපැලෙන් අවශ්‍ය අයට රු. 1.10 ක මනිඕඩරයක් හෝ පෝස්ටල් ඕඩරයක් විභාග කොමසාරිස් නමට එවීමෙන් ලබාගත හැකිය.

## 1970 පෙබරවාරි—ඉංග්‍රීසි ගුරු විභාගය සඳහා අයදුම්පත්‍රය

විභාගයට ඉල්ලුම් කරන කොටස :———. විභාග අංකය :———.

(මෙහි ඒ හෝ බී යන්න ලොකු අකුරින් ලියන්න) (කාර්යාලයේ ප්‍රයෝජනය සඳහායි)

1. අයදුම්කරුගේ පුරුදු අත්සන :————.
ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන වග :————.

2. අයදුම්කරුගේ සියලුම නම් සම්පූර්ණයෙන් :————.
(පූජකවරයෙක් හෝ මෙහෙනියක් හෝ මහත්මියක් හෝ නම් ඒ බව සඳහන් කරන්න. ගුරුවරයකු ශවයෙන් පත්ව සිටි නම් පත්වීමේදී ව්‍යවහාර කළ නම ලිවිය යුතුය. එසේ නැතහොත් උප්පැන්න සහතිකයේ සඳහන් නම ලියන්න)

3. ලිපිනය—(i) පෞද්ගලික :————.
(ii) සේවය කරන ස්ථානයෙහි ලිපිනය :————.

4. මධ්‍යස්ථානය (වඩා කැමති මධ්‍යස්ථානය පිළිවෙලින් ලියන්න)
(1) ———.
(2) ———.
(3) ———.
(ස්ථාන තුන එකිනෙකට වෙනස් විය යුතුය.)

5. විභාග ගාස්තු සඳහා අවශ්‍ය මුද්දර මෙහි අලවන්න. (ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර විභාගයේ "ඒ" කොටස සඳහා රු. 25 යි. එම "බී" කොටස සඳහා රු. 20 යි)

> මුද්දර අලවන කොටුව
> මේ මුද්දර අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කර සහතික කළ යුතුය. මුද්දර එක පිට එක නො සිටින සේ ඇලවිය යුතුය.

6. පුරවැසිභාවය—පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද ලියාපදිංචි වීමෙන් නම් සහතික පත්‍ර අංක දිය යුතුයි.

7. (i) උපන් දිනය :————.
(ii) 1970 ජනවාරි 1 දිනට වයස : අවු :———. මාස :———. දින :————.

8. (i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය සමත් වූ—
අවුරුද්ද :———. මාසය :———. විභාග අංකය :——.
(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වූ—
අවුරුද්ද i :———. මාසය i :———. විභාග අංකය i :——.
ii :———. ii :———. ii :——.
(iii) ඉංග්‍රීසි භාෂාව "අ" නිර්දේශය සමත් වූ—
අවුරුද්ද :———. මාසය :———. විභාග අංකය :———.
(iv) ඉංග්‍රීසි භාෂාව "ආ" නිර්දේශයෙන් සම්මාන සාමාර්ථයක් ලත් අවුරුද්ද :————. මාසය :————. විභාග අංකය : ————.

9. ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර විභාගයේ "බී" කොටසට පෙනී සිටින්නේ නම් "ඒ" කොටස සමත් වූ අවුරුද්ද :————. මාසය :————. විභාග අංකය :————.

10. ගුරුවරයාගේ ලියාපදිංචි කළ අංකය හෝ එම පත්වීම පිළිබඳ නිකුත් කරන ලද ලියමනේ අංකය හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් තැන හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැන විසින් පත්වීම අනුමත කිරීම පිළිබඳ ලියමනේ හෝ විස්තර මෙහි සඳහන් කළ යුතුය.

11. තමන් සමත් වූ අන් කිසි විභාගයක් නිසා හෝ සේවය නිසා හෝ නිදහසක් ඉල්ලන්නේ නම් ඒ පිළිබඳ විස්තර :——.
නිදහස ඉල්ලන්නේ කවර කොටසින් ද :————.

12. **දැනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් සඳහා පමණී.**
පාසැලේ කළමනාකාර තැන විසින් හෝ මුල්ගුරු තැන විසින් හෝ මේ කොටස පිරවිය යුතුය :—

මෙම අයදුම්කරු පිළිබඳ ලිපිලේඛනාදිය මා පරීක්‍ෂා කළ බවත්, එම ලිපි ලේඛනාදිය අනුව මෙම අයදුම්පතෙහි 10 වැනි හා 11 වැනි කොටුවල ලියා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි.

පාසැලේ නම :————.
එහි පාලනය :————.

(ආණ්ඩුවේ පාසැලක් ද / අධ්‍යක්ෂ පාලිත පාසැලක් ද / අනුමත කළ ආධාර නොලබන පාසැලක් ද)

සහතික කරන අයගේ නාම :————.

අත්සන :————. ලිපිනය :————. දිනය :————.

13. අයදුම්කරුගේ සහතිකය :————.
මේ අයදුම්පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි. මෙහි අලවා තිබෙන මුද්දර මා විසින්ම ඇල වූ බවත්, ඒවා මීට ඉහතින් පාවිච්චි නො කළාවූ ද දැනට වලංගු වූ ද, හොඳ මුද්දර බවත් මෙයින් සහතික කරමි. තවද විභාග කොමසාරිස් විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී පිළිපැදිය යුතු අණපනත්වලටත් එකඟව ඉන් බැඳී සිටීමට ද මෙයින් පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (සෑම අයදුම්කරුවකුම සඳහා)————වන මම ඉහත සඳහන් අයදුම්කරු———— පදිංචි වූ කෙනෙකු බවද, මා ඔහු/ඇ හොඳාකාර අඳුනන බව ද, 1969 ක් වූ ———— මස —— වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ අත්සන :————.

තරාතිරම :————.

දිනය :————.

නම :————

ලිපිනය :————.

සැ. යු. අයදුම් පත්‍රයෙහි 14 කොටුවෙහි අයදුම්කරුගේ අත්සන සහතික කරවා ගැනීම පහත සඳහන් සුදුසුකම් ඇති අයෙකු ලවා කරවා ගත යුතුය.

ගුරුවරයෙකු/ගුරුවරියක වන අයදුම්කරු විසින් තමන් ඉගැන්වීම කරන පාසැලේ ප්‍රධානයා ඉදිරියේ අත්සන තබා සහතික කරවා ගත යුතුය.

දැනට ගුරුවරයෙකු/ගුරුවරියක නොවන අයදුම්කරු විසින් තමන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, පෙරකදෝරු කෙනකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු, නාවුක ගගන හෝ ගොඩ යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු, හෝ එවැනි පාසලක එම තත්ත්වයේ සිට විශ්‍රාමලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාම සේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

නියමිත සුදුසුකම් ඇති අයෙකු විසින් තම අත්සන සහතික කරන ලද බවට අයදුම්කරු වග බලා ගත යුතුයි.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1969 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදීය.

11–483—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කාකි ඩ්‍රිල් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමට 1969.10.9 වෙනි දින ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද නිවේදනය අවලංගු කළා සේ ටෙන්ඩර් කරුවන් කරුණාවෙන් සළකන්න.

දෙපාර්තමේන්තුවේ නම සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ පදවි නාමයද වෙනස්කර තිබෙන බව කරුණාවෙන් සටහන් කර ගන්න.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1969.11.14 දින,
කොළඹ දීය.

11–447—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වෑනේ සහ චීනච්චට්ටි පයිප්ප සහ පිරිද්දීම් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

වෑනේ සහ චීනච්චට්ටි පයිප්ප සහ පිරිද්දීම් සැපයීම සහ ගෙනැවිත් භාරදීම සඳහා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 දෙසැම්බර් මස 28 වන දින ප. ව. 2.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, අවශ්‍ය ටෙන්ඩර් පත් සහ විස්තර පේරාදෙණියේ, ගන්නොරුවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කායාලයෙන් ලබා ගත හැකි අතර, අවශ්‍ය අනිකුත් විස්තරද ඔහුගෙන් ලබා ගත හැක.

3. 1969 දෙසැම්බර් මස 27 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරන අතර, ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා පැමිණෙන විට රු. 25ක ටෙන්ඩර් තැන්පත් රිසිට්පතක් ඉදිරිපත් කළ යුතුය. 1969 ජනවාරි 31 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකල මගේ 69.1.21 දරණ දැන්වීම අනුව මෙම තැන්පත් මුදල මතම ඒ සඳහා ඉල්ලීමක් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

4. ටෙන්ඩර් තැන්පත් පේරාදෙණියේ, කෘෂිකර්ම, දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
ප්‍රධාන ඉංජිනේරු.

කෘෂිකර්ම ඉංජිනේරු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය.
1969.11.3.

11–430—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1970.1.1 සිට 1970.6.30 දින දක්වා ගවමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.12.5 දින අ. භා. 2.30 මන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.12.5 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.11.4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11–475—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ ට්‍රිපොලි වෙළඳ සැලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ රෝහල් සැපයීමේ මූලස්ථානයට සහ ට්‍රිපොලි වෙළඳ සැලට 1970 ජනවාරි මස 1 වෙනිද සිට 1970 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා සූරුට්ටු, රට දුම්කොළ, සිංහල දුම්කොළ සහ හුණු සැපයීම පිණිස මිළ ගණන් පත් 1969 දෙසැම්බර් මස 6 වෙනි සෙනසුරාද අ. භා. 2.30 දක්වා කොළඹ 1, චැතැම් වීදියේ අංක. 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

1969 දෙසැම්බර් මස 6 වැනි සෙනසුරාදා දවල් 12 වනතෙක් අලෙවි කිරීමේ කොමසාරිස් කර්යාලයෙන් ලබාගතහැකි මිළ ගණන් පෝර්මයෙහි මිළ සඳහන් කර එවිය යුතුයි. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගත හැක.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.11.4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

11–476—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ට්‍රිපොලි වෙළඳ හලේ එළුමස්/කුකුල්මස්/ගවමස් හා ඌරුමස් කඩපිල් බදුදීම

ට්‍රිපොලි වෙළඳ හලේ පිහිටි එළුමස්/කුකුල්මස්/ගවමස් හා ඌරු මස් කඩපිල් 1970.1.1 සිට 1970.12.31 දක්වා එළුමස්, ගවමස්, කුකුල් මස් හා ඌරුමස් විකිණීම පිණිස බදුදීම සඳහා, කොළඹ 1, චැතැම් වීදියේ අංක 61 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1969.12.6 දින අ. භා. 2.30 දක්වා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1969.12.6 දින දවල් 12 දක්වා ඉල්ලුම් පත් ලබාගත හැක. ඉල්ලුම් පත් අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ ට්‍රිපොලියේ සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ දැනගත හැක.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දිය.

11–477—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1970.1.1 සිට 1970.6.30 දින දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969.12.5 දින අ. භා. 2.30 වන තුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.12.5 දින දවල් 12 ග දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

11–478—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1970.1.1 සිට 1970.6.30 දින දක්වා එළු මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969.12.5 දින අ. භා. 2.30 වන තුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.12.5 දින දවල් 12 ග දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

11–479—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1970.1.1 සිට 1970.6.30 දක්වා කාලය තුළ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ මුළුතැන්ගෙය, බේකරිය හා ට්‍රිපොලි වෙළඳ සැලෙහි එකතු වන සත්වාහාර සඳහා සුදුසු ද්‍රව්‍ය මිලදී ඉවත් කරගෙන යාම සඳහා මිල ගණන් කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 දෙසැම්බර් මස 6 දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

මිල ගණන් පෝර්ම 1969.12.6 දින දවල් 12 දක්වා, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

11–480—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1970 දෙසැම්බර් මස 31 දිනයෙන් අවසන් කාලය සඳහා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්හි ඇති අපිරිසිදු රෙදි පිරිසිදු කිරීම සඳහා මිල ගණන් ඉල්ලුම් පත් කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 දෙසැම්බර් මස 6 වැනි දින අ. භා. 2.30 දක්වා භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1969 දෙසැම්බර් මස 6 වැනි දින දවල් 12 ග දක්වා මිල ගණන් ඉල්ලුම් පත්‍ර ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

11–481—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1970.1.1 සිට 1970.6.30 දින දක්වා කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969.12.5 දින අ. භා. 2.30 වන තුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969.12.5 දින දවල් 12 ග දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 11. 4 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

11–482—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා පහත සඳහන් කාර්යාංශයන් සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය සැපයීමට 1969/70 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා මිල ගණන් කැඳවීම.

කොළඹ, ගාල්ල, කළුතර බදුල්ල සහ යාපනය දිස්ත්‍රික්කයන් තුල පිහිටි පහත සඳහන් කාර්යාංශවලට ප්‍රාදේශීය ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1969 දෙසැම්බර් 20 වැනි දින පෙ. ව. 12 දක්වා පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් මිල ගණන් භාරගනු ලැබේ.

**කොළඹ දිස්ත්‍රික්කය**

1. සහතික කළ බාලිකා පාසැල, රම්මුතුගල
2. වුඩ්පර්ඩ් පිරිමි පාසැල, මාකොළ
3. රිමාන්ඩ් නිවාසය, දෙහිවල

**ගාල්ල දිස්ත්‍රික්කය**

1. සහතික කළ පාසැල, කොග්ගල
2. ළමා නිවාසය, ගාල්ල
3. ලේක් පාසැල, හික්කඩුව

**කළුතර දිස්ත්‍රික්කය**

1. ළමා නිවාසය, පානදුරය

**බදුල්ල දිස්ත්‍රික්කය**

1. සහතික කළ පාසැල, කැප්පෙටිපොල
2. ළමා නිවාසය, බණ්ඩාරවෙල

**යාපනය දිස්ත්‍රික්කය**

1. ෂන්හැම් පාසැල, අච්චුවේලි

**අවශ්‍ය ද්‍රව්‍ය**

1. 6″×9″ කළුගල් කියුබ් එකක්
2. $\frac{3}{4}$″ කැටගල් කියුබ් එකක්
3. ගංවැලි කියුබ් එකක්
4. පිලිස්සූ ගඩොල් 1,000ක් (පිළිගත් ප්‍රමාණය $8\frac{3}{4}$″×$4\frac{1}{2}$″×$2\frac{3}{4}$″)
5. තම්බාපු හුණු බුසලක් (ගෝනියත් සමග රු. 85කට අඩු නොවිය යුතුය.)
6. අළුහුණු බුසලක් (ගෝනියත් සමග රු. 42 කට අඩු නොවිය යුතුය.)
7. උණ ගස් අඩි 25 ටත් 30 ටත් අතර.

ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා වෙන වෙනම රු. 50 බැගින් මෙම කාර්යාලයේ හෝ ඕනෑම දිස්ත්‍රික් කාර්යාලයක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක අනුව ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට පෙර ඉදිරිපත් කළ යුතුය. 1969 දෙසැම්බර් 20 වැනි දින දහවල් 10.30 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝරමවල ඉල්ලුම්කළ යුතු අතර, 1969 දෙසැම්බර් 20 වෙනි දින පෙරවරු 12 ට පෙර මෙම කායර්ාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම කළ හැක. ටෙන්ඩරය ලිපි කවරයක බහා සීල් තබා කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර" යනුවෙන් සඳහන් කළ යුතුය.

1969 දෙසැම්බර් මස 20 දින පෙරවරු 2.30 ට කොළඹ 1, වැනැම් වීදියේ අංක 103 1/1 දරන ද මැල් ගොඩනැගිල්ලේ පිහිටි පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්ට දැන්වූ විට සතියක් ඇතුලත දී ඔවුන් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත කාලසීමාවක් තුලදී එම ගිවිසුමකට නොබැඳුනහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර ඔවුන්ගේ නම් කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් වන්නේ ය.

ඇම්. වී. ඩී. චන්ද්‍රරත්න,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තැන වෙනුවට.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
103 1/1, වැනැම් වීදිය,
කොළඹ 1.

11–456—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් දැන්වීමයි

1970 වර්ෂයට අවශ්‍ය බස් ටිකට් මුද්‍රණයකර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969, දෙසැම්බර් මස 18 වෙනිදා පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින්ද, යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් කොළඹ 5, නො. 200, කිරුළ පාරේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් 1969 දෙසැම්බර් මස 17 වෙනිදා දවල් 12 වනතෙක් ලබා ගත හැකිය. පෝර්මපත් ලබා ගැනීමට කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නාලද රිසිට් පත ඉදිරිපත් කල යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

200, කිරුළ පාර,
කොළඹ 5, 1969.11.3.

11–591—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

වාලච්චෙනෙහි අප කම්හලට බඩු තොග (බල්ක් කාගෝ) ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවේ.

69.12.14 වැනි දින පස්වරු 2 ට ටෙන්ඩර් භාරගැන්ම අවසන් කෙරේ. ටෙන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර අයදුම් කර ලබාගත හැකිය.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2 යුනියන් පෙදෙසේ 356 ගිඩීය.
1969 නොවැම්බර් 18 දින.

11–593—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ගැල්වනයිස් ජලනල සැපයීම

| සැපයීම් වර්ගය හෝ සේවය | ලද ටෙන්ඩර් ගණන | ප්‍රමාණය හා මිනුම් ප්‍රමාණය | පිළිගත් ටෙන්ඩර්කරු | පිළිගත් මිළ |
|---|---|---|---|---|
| 1957 බ්‍රිතාන්‍ය සම්මත විස්තර පත්‍රිකා අංක 1387 ට (මධ්‍යම වර්ගය) හෝ ඊට සමාන විස්තරයකට අනුකූල ජලනල තැලෙන සුළු ගැල්වනයිස් යකඩ, හේත්තු වැල්ඩිං කළ ඉස්කුරුප්පු කපා ඇඳන ලද, අඩි 15/20 කොටස් වලින් | ...මුල් ටෙන්ඩර 8 යි... ...ප්‍රමාදවීලත් ටෙන්ඩර් 2යි | (1) ඇතුළත විෂ්ක. ½" ක්වූ දිග අඩි 9500යි... (2) ඇතුළත විෂ්ක. ¾"ක්වූ දිග අඩි 8,000යි (3) ඇතුළත විෂ්ක. 1"ක්වූ දිග අඩි 18,050යි (4) ඇතුළත විෂ්ක. 1¼"ක්වූ දිග අඩි 5,000යි (5) ඇතුළත විෂ්ක. 1½"ක්වූ දිග අඩි 9,150යි (6) ඇතුළත විෂ්ක. 2"ක්වූ දිග අඩි 9,650යි (7) ඇතුළත විෂක. 3" පිළි නොගන්නා ලදී | ...නෂීරා වරේඩිං සමාගම.. 409, මාලිගාවත්ත පාර, කොළඹ | (1) දිග අඩියක් ශ. 98 බැගින් (ළඟ ඇති තොගයෙන්) (2) දිග අඩියක් රු. 1.34 බැගින් (ළඟ ඇති තොගයෙන්) (3) දිග අඩියක් රු. 1.68 බැගින් (ළඟ ඇති තොගයෙන්) (4) දිග අඩියක් රු.2.18 බැගින් (ළඟ ඇති තොගයෙන්) (5) දිග අඩියක් රු. 2.58 බැගින් (ළඟ ඇති තොගයෙන්) (6) දිග අඩියක් රු. 3.18 බැගින් (ළඟ ඇති තොගයෙන්) |

1969.11.14 දින,
කොළඹදීය.

සැ. ඔ. පෙ. රූපසිංහ,
ගබඩා අධිකාරී.

11–446—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 1969/70 වර්ෂය තුළ වෛද්‍ය පර්යේෂණායතනයට සතුන් සැපයීම

ලැබුණු මුළු ටෙන්ඩර් ගණන: 4

තෝරගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය :—

ඩබ්ලිව්. එල්. ජී. ප්‍රනාන්දු මයා.,
" සිරිමතී ",
වැලිගම්පිටිය, ජා-ඇල.

| | | | මිල රු. ශ. |
|---|---|---|---|
| 1. | වඳුපැටව් | ... | 85 00 |
| 2. | මීවැස් සියෝ | ... | 85 00 |
| 3. | බැටළුවෝ | ... | 87 50 |
| 4. | එළුවෝ | ... | 87 50 |
| 5. | ලොකු හාවෝ | ... | 10 50 |
| 6. | සාමාන්‍ය හාවෝ | ... | 10 50 |
| 7. | රටහාවෝ | ... | 10 50 |
| 8. | මීයෝ | ... | 1 00 |
| 9. | රට මීයෝ | ... | 7 00 |
| 10. | වඳුරෝ | ... | 20 00 |
| 11. | ගෙම්බෝ | ... | 1 00 |
| 12. | බළල් ප්‍රු | ... | 5 00 |

වී. අයියාමුත්තු,
සෞ. සේ. අධ්‍යක්ෂ වෙනුවට.

11–460—69.11.14 දින අංක 14,880 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1969

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.